## මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතිය III අදියරේ ( පිටත වටරවුම මහාමාර්ග ව්‍යාපෘතිය) -2020

---

මහ කොළඹ නාගරික ප්‍රවාහන සංවර්ධන ව්‍යාපෘතියේ III අදියරේ ( පිටත වටරවුම මහාමාර්ග ව්‍යාපෘතිය) 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ චීන ආනයන හා අපනයන බැංකුව සමඟ 2014 සැප්තැම්බර් 16 දින එළඹි අංක පිබීසී (2014) 15 එකතු අංක (309) දරන ණය ගිවිසුම සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

### 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට වරාය හා මහාමාර්ග අමාත්‍යාංශය වර්තමානයේ මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ නියෝජිතායතනය වන අතර මාර්ග සංවර්ධන අධිකාරිය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණ වන්නේ, කොළඹ ප්‍රධාන නගරයේ ප්‍රවාහන තදබදය අඩු කිරීමට හා රටේ අනිකුත් ප්‍රදේශවලට සම්බන්ධතාවය වැඩිදියුණු කිරීම සඳහා දක්ෂිණ අධිවේගී මාර්ගය සහ කොළඹ නගරයෙන් පිටතට යන අනෙකුත් ජාතික මාර්ගවලට සම්බන්ධ කෙරෙන කොළඹ නගරයෙන් බැහැර අධිවේගී මාර්ගයක් ඉදිකිරීම තුලින් ශ්‍රී ලංකාවේ පලාත් අතර ආර්ථික සංවර්ධනය ශක්තිමත් කිරීමට දායක වීමය. ණය ගිවිසුමට අනුව ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත පිරිවැය එ.ජ.ඩො මිලියන 590 කට සමාන රු.මිලියන 76,200ක් වූ අතර ඉන් එ.ජ.ඩො. මිලියන 494 කට සමාන රු.මිලියන 63,356ක් මූල්‍යයනය කිරීමට චීන ආනයන හා අපනයන බැංකුව එකඟවී තිබුණි. ව්‍යාපෘතිය එහි කටයුතු 2014 අගෝස්තු ආරම්භ කර තිබුණු අතර 2019 ජුනි වන විට අවසන් කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත්, ව්‍යාපෘතියේ කටයුතු 2020 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි.

### 1.3 තත්ත්වාගණනය කළ මතය

---

මාගේ වාර්තාවේ 2.1 වගුවේ දැක්වෙන කරුණු වලින් වන බලපෑම හැර,ව්‍යාපෘතියේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| (අ) පිටත වටරවුම මහා මාර්ග ව්‍යාපෘතියේ (අදියර I) 2015 දී අවසන් කර තිබීම හා ලිඛිත සාක්ෂි නොමැතිවීම හේතුවෙන් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කරන ලද වගකීම් යටතේ දක්වා ඇති රු. මිලියන 1,984ක පිටත වටරවුම මහා මාර්ග ව්‍යාපෘතියේ (අදියර I) හි ජංගම ගිණුමේ ශේෂය විගණනයේදී සත්‍යාපනය කර ගත නොහැකි විය. | ව්‍යාපෘති කාර්යාලය සම්පූර්ණයෙන් වසා ඇති අතර සියලුම වත්කම් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කර ඇත. | වාර්තා කරන දිනට ව්‍යාපෘතියේ වත්කම් හා වගකීම්වල නිවැරදි වටිනාකම දැක්වීමට පියවර ගත යුතුය. |
| (ආ) 2020 වර්ෂය සඳහා ඇවර කිරීමේ ගිණුම් අනුව කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ශේෂය සහ විගණනය වෙත ලැබී තිබුණු තොරතුරු අතර රු.මිලියන 200ක වෙනසක් නිරීක්ෂණය විය. | කොන්ත්‍රාත්කරුවන්ට රඳවා තබා ගත් මුදල් සම්පූර්ණයෙන් නිදහස් කර නොමැති අතර අසම්පූර්ණ වැඩ සඳහා සමහර ගෙවීම් රඳවා ගෙන ඇත. | 2020 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු ශේෂය සහ ව්‍යාපෘතියේ අනෙකුත් තොරතුරු සමග සංසන්දනය කිරීමට පියවර ගත යුතුය. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික හා මූල්‍ය ප්‍රගතිය

ව්‍යාපෘතියේ ඉදිකිරීම් වැඩ සඳහා කොන්ත්‍රාත්තුව රු. මිලියන 66,690ක පිරිවැයකට 2013 පෙබරවාරි 21 දින පිරිනමා තිබුණු අතර මාස 16ක ප්‍රමාදයකින් පසු මාර්ගයේ ඉදිකිරීම් වැඩ 2016 ජනවාරි 01 දින ආරම්භ කර තිබුණි. මාර්ගයේ ඉදිකිරීම් කටයුතු 2019 ජුනි 13 දින නිමකිරීමට අපේක්ෂා කර තිබුණද වැඩබිමේ අයිතිය පවරාදීමේ ප්‍රමාදය හේතුවෙන් එය 2019 දෙසැම්බර් 10 දක්වා දින 180කින් කාලය දීර්ඝ කර තිබුණි. කෙසේවෙතත්, රු. මිලියන 1,417ක් වටිනා වඩාත් අවශ්‍ය කටයුතු නිම කිරීමකින් තොරව 2019 නොවැම්බර් 09 දින පිටත වටරවුම මහා මාර්ගය මහජනතාව සඳහා විවෘත කරන ලදී. ව්‍යාපෘතිය අවසානයේදී ඉලක්කගත ප්‍රගතිය වූ සියයට 100 එරෙහිව ව්‍යාපෘතිය වාර්තා කළ භෞතික ප්‍රගතිය සියයට 95 ක් විය.

### 3.2 කොන්ත්‍රාත් පරිපාලනය

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
| --- | --- | --- |
| (අ) ණය මුදලේ එ.ජ.ඩො මිලියන 494කින් ණය කාලසීමාව අවසාන වීමට පෙර ව්‍යාපෘතිය විසින් එ.ජ.ඩො මිලියන 115.49ක් උපයෝජනය කර නොතිබුණි. තවද, ණය කාලය අවසාන දිනට ණය ගිණුමට බැදීම් ගාස්තු රු.මිලියන 91.63 ක්, ගෙවීම් ප්‍රමාදවීම මත පොළිය රු.මිලියන 87.20ක් සහ විනිමය අලාභය රු. මිලියන 9,308.22ක් අයකර තිබුණි. කෙසේවෙතත්, | වර්ෂ 05කට පසුව 2019.12.03 දින එක්සිම් බැංකු ණය ඉකුත්වීම ප්‍රධාන ගැටළුව විය. නමුත්, දේශපාලන හේතූන් නිසා 2015 දී ණය උපයෝජනය කිරීමට නොහැකි විය. ණය මුදල එ.ජ.ඩො මිලියන 494.04ක් වූ අතර අවසාන දිනය තෙක් අපට වියපැහැදම් කිරීමට හැකි වූයේ | ණය පහසුකම ඉකුත්වීමට පෙර මුළු ණය මුදල උපයෝජනය කිරීමට ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු නිසි පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |

| | | |
|---|---|---|
| 2021 මාර්තු 26 දින වන විටත් රඳවා තබා ගත් මුදල් ඇතුළුව කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු එකතුව රු.මිලියන 765.49ක් නිරවුල් කිරීමට නොහැකි වී තිබුණි. | එ.ජ.ඩො මිලියන 378.54ක් පමණි. | |

| | | | |
|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘතියේ මුළු පිරිවැය ඇස්තමේන්තුව නිවැරදිව පිළියෙල කර නොතිබුණු අතර ප්‍රමාණ පත්‍රවල සඳහන් රු. මිලියන 2,506 ක් වටිනා අයිතම් 64ක් සඳහා කොන්ත්‍රාත්කරු විසින් සම්පූර්ණයෙන්ම කටයුතු කර නොතිබුණු අතර ප්‍රමාණ පත්‍රයේ සඳහන් රු. මිලියන 3,721 ක් වටිනා අයිතම් 11ක ඉදිකිරීම් කටයුතු සියයට 50 වඩා අඩුවෙන් නිමකර තිබුණි. | ප්‍රමාණ පත්‍රයේ සඳහන් මුළු වටිනාකම භාවිත නොකරන ලද වෙනත් අයිතම 62 ක් පවතී. කෙසේවෙතත්, සෑම දෙයක් සඳහා පැහැදිලි හේතු පවතින අතර මෙම අයිතම්වල ඉතිරිවීම් පවතී. | අදාළ විස්තරාත්මක ඉංජිනේරු අධ්‍යයනය, පස පරීක්ෂාව, නිර්මාණය සහ ව්‍යාපෘතියේ ප්‍රමාණ පත්‍ර අනුගමනය කරමින් ව්‍යාපෘතියේ පිරිවැය ඇස්තමේන්තුව නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ඇ) | ව්‍යාපෘතිය ප්‍රමාණ පත්‍රයේ අංක 10.12 අයිතමය සඳහා වෙන්කර තිබූ රු. මිලියන 1,500ක වෙන් කිරීමට එරෙහිව මෘදු බිම් සකස් කිරීම සඳහා රු. මිලියන 3,961ක් වියදම් කර තිබුණි. | මෘදු බිම් සකස් කිරීම හෝ ආරම්භක වැඩ කටයුතුවලට එළඹීමට පෙර සත්‍ය පිරිවැය ඇස්තමේන්තු කිරීමට හෝ තීරණය කිරීමට කිසිවකුට නොහැකිය. | විස්තරාත්මක ඉංජිනේරු අධ්‍යනය, පස පරීක්ෂාව සහ ව්‍යාපෘතියේ අදාළ මාර්ග කොටස සඳහා නිර්මාණය සිදු කිරීමෙන් පසු මෘදු බිම් සකස් කිරීම සඳහා වෙන් කිරීම් කළ යුතුය. |
| (ඈ) | කොන්ත්‍රාත්තුව සඳහා යොදා ගන්නා ලද මුදල් කොටස සියයට 65ක් එ.ජ.ඩො සහ සියයට 35ක් ශ්‍රී ලංකා රුපියල්වලින් වුවද, කොන්ත්‍රාත්තුව පිරිනමන අදියරේදී හඳුනා නොගත් විෂය පථය වෙනස්වීම් සහ අමතර කටයුතු හේතුවෙන් ව්‍යාපෘතිය එ.ජ.ඩො කොටස සියයට 65 වඩා වඩා වැඩියෙන් යොදාගත් අවස්ථා 51 තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් එ.ජ.ඩො 566,276කට සමාන රු.මිලියන 72.6ක අමතර පිරිවැයක් දරා තිබුණි. | විෂය පථය වෙනස්වීම් සහ අමතර වැඩ කොන්ත්‍රාත් පිරිනමන අදියරේදී හඳුනා ගෙන නොමැති බව පැවසිය නොහැක. දේශපාලනික හේතුන් මත හිතාමතාම විෂය පථය වෙනස් කර තිබුණි. | කොන්ත්‍රාත් බිල්වල විදේශීය සහ දේශීය කොටස දෙපාර්ශවය විසින් පැහැදිලිව එකඟ විය යුතු අතර කොන්ත්‍රාත් කොන්දේසිවලට ඇතුළත් කළ යුතුය. |

**3.3** ඉඩම් අත්පත් කර ගැනීම පිළිබඳ ගැටලු

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශ |
|---|---|---|
| ලැබී තිබුණු තොරතුරු අනුව, මාර්ග ඉදිකිරීමේ අරමුණින් ව්‍යාපෘතිය විසින් වත්තල සහ මාතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල යටතේ පවතින රජයේ ඉඩම් කොස් 293ක් ඇතුළුව ඉඩම් කොටස් 1,705ක් අත්කර ගෙන තිබුණු අතර 2019 දෙසැම්බර් 31 දිනට ඒ මත වන්දි මුදල් රු.මිලියන | ව්‍යාපෘති මුළු කාලපරිච්ඡේදය තුළදී බලපෑමට ලක් වූ ජනතාවට වන්දි ගෙවීමේ ප්‍රමාදයන් සිදු වී ඇති අතර වගන්ති 17 යටතේ ගෙවීම් ප්‍රමාදය සඳහා පොළී ගෙවීම් ලබා ගැනීමට බලපෑමට ලක් වූ ජනතාව හිමිකම් ලබයි. අත්පත් කර ගත් ඉඩම්වල | ඉඩම් අත්පත් කර ගැනීමේ කටයුතු වේගවත් කිරීමට සහ ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ 44 වගන්තිය යටතේ ඉඩම් ලියාපදිංචි කිරීමට |

| | | |
|---|---|---|
| 9,308.22ක් ගෙවා තිබුණි. තවද, වන්දි ගෙවීමේ ප්‍රමාදය හේතුවෙන් 2020 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතිය විසින් පොලී මුදල රු. මිලියන 1,082.77ක් ගෙවා තිබුණි. කෙසේවෙතත්, ඉඩම් කොටස් 423ක අයිතිය පමණක් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කර තිබුණි. | හිමිකම මාර්ග සංවර්ධන අධිකාරිය වෙත මාරු කිරීමේ හෝ වගන්ති 44 දැන්වීම නිකුත් කිරීමේ ප්‍රමාදයක් පවතින බව පිළිගනු ලැබේ. 44 වගන්තිය යටතේ දැන්වීම් නිකුත් කිරීමේ ක්‍රියාවලිය වේගවත් කිරීමට පියවර ගනු ලැබේ. | පියවර ගැනීම අවශ්‍ය වේ. |

## 3.4 ඌනඋපයෝජිත සම්පත්

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| මුතුරාජවෙල ප්‍රදේශයේ පිටත වටරවුම මහාමාර්ග ව්‍යාපෘතිය මගින් අවතැන් වූ ජනතාව නැවත පදිංචි කිරීම සඳහා 2019 ජූලි මාර්ග සංවර්ධන අධිකාරිය විසින් උස්වැටකෙයියාව ඉඩම මිලදී ගැනීම සඳහා රු. මිලියන 15.85 ක මුදලක් සහ මාබෝල ඉඩම සඳහා රු. මිලියන 47.55ක් දරා තිබුණි. කෙසේවෙතත්, 2021 පෙබරවාරි 25 දින වන විටත් නැවත පදිංචි කිරීමේ කටයුතු සඳහා ව්‍යාපෘතිය විසින් මෙම ඉඩම් දෙකම භාවිත කර නොතිබුණි. | 2020 දෙසැම්බර් 31 දිනෙන් ව්‍යාපෘතිය අවසන් නිසා මෙම ඉඩම් කොටස් තවදුරටත් ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය නොවේ. | ව්‍යාපෘතියට අලාභ අවම වීමට ව්‍යාපෘතියේ ඉඩම් අත්පත් කර ගැනීමේ සහ නැවත පදිංචි කිරීමේ කටයුතු නියමිත පරිදි සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |

## 3.5 පාරිසරික ගැටලු පිළිබඳ ගැටලු

| විගණන ගැටලුව | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|
| මුළු පැමිණිලි ගණන 735 ක් වූ අතර ඉන් පැමිණිලි 643ක් කොන්ත්‍රාත්කරු විසින් විසදා තිබුණි. ඒ අනුව, 2020 වර්ෂය අවසාන දිනට පැමිණිලි 09ක් විසදා නොතිබුණි. | ලැබී තිබුණු මුළු පැමිණිලි ගණන 735 ක් වේ. ඉන් පැමිණිලි 643 ක් විසදා තිබුණි. | කොන්ත්‍රාත්කරුගේ රක්ෂණාවරණයේ වලංගු කාලය තුළ සියලු පැමිණිලි නිරවුල් කිරීමට අවශ්‍ය පියවර ගත යුතුය. |